**<u>2023. මාර්තු මස 02 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු රැස්වීම් වාර්තාව.</u>**

2023 ක් වූ මාර්තු මස 02 වන දින පෙ.ව 9.30 ට පමණ ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පරිසර හා පහසුකම් කමිටුව ආරම්භ විය.

**<u>පැමිණීම</u>**

01. ගරු ප්‍රාදේශීය සභා සභාපති - ආනන්ද වීරසිංහ මහතා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල වීරසිංහ මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රේමවංශ වර්ණකුල මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දිප්ති අබේනායක මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.සුනේත්‍රා මහත්මිය
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රුචිර යකල්ලේආරච්චි මහතා

ලේකම් - නාලිකා අබේකෝන් මහත්මිය

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රෙජී වෙල්ලප්පිලි මහතා

පළමුවෙන්ම එදින කමිටුව සඳහා පැමිණි ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන් ගෞරවයෙන් පිළිගන්නා ලද්දේ ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතා විසිනි.

පසුව පසුගිය කමිටුවේදි ගන්නා ලද තීරණයක් පිළිබඳව ප්‍රගතිය විමසා බලන ලදි .

01. යකඩගලහේන සුසාන භූමිය මැණුම් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කරන ලදි.

02. මාළු ලැලි සකස් කර ඇති කොටසේ ඉතිරි වැඩ කටයුතු නිම කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව තීරණය කරන ලදි.

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දිනට නියමිත වැඩ කටයුතු අවසන් බැවින් පැමිණි සියලු දෙනාට ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතා විසින් ස්තුති කරමින් පරිසර හා පහසුකම් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ආනන්ද වීරසිංහ,
කමිටු සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.